## ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව
## කොළඹ දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.
----------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 31 දින නගරාධිපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) රාජගිරිය ගුවන් පාලම ඉදිකිරීම සඳහා සභාවට අයත් ඉඩමෙන් හෙක්ටයාර් 0.32 ක ප්‍රමාණයක් ලබාදීම වෙනුවෙන් සභාවට අයවිය යුතු වටිනාකම තක්සේරුකර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

(ආ) සභා බලප්‍රදේශයේ දහම් පාසැල් සඳහා 2017 නොවැම්බර් මාසයට කිරි ලබාදීම වෙනුවෙන් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට ගෙවිය යුතු රු.426,960 ක් ගිණුම්ගතකර නොතිබීම නිසා වර්ෂයේ වියදම් හා ණය හිමියෝ එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ඔබේසේකරපුර ක්‍රීඩාංගණයේ 2017 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා ගෙවිය යුතු රු.86,341ක්වූ විදුලි බිල්පත ගිණුම්ගතකර නොතිබිම නිසා වර්ෂයේ වියදම හා ණයහිමියෝ එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) කොළඹ අගනගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන අමාත්‍යාංශයෙන් 2016 නොවැම්බර් 13 දින සභාවට ලැබී තිබුණු කසළ බැහැර කිරීමේ වාහන 08ක හා අමතර කොටස් 06ක වටිනාකම තක්සේරුකර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත්කර නොතිබුණි.

(ඉ) 2016 වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතු විගණන ගාස්තු රු.270,000 ක් අධිවෙන් කිරීම නිසා ණය හිමියෝ හා වියදම් එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) 2014 හා 2016 වර්ෂවල පුස්තකාල පොත් සමීක්ෂණ අනුව සභාවට අයත් පුස්තකාල 04 ක අබලි හා භාවිතයට නුසුදුසු වටිනාකම රු.2,298,285 ක්වූ පොත් ගිණුමෙන් ඉවත්කර නොතිබීම හේතුවෙන් අවසන් තොගය හා වර්ෂයේ අතිරික්තය එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු වෙනුවෙන් ගිණුම්වල වෙන්කිරීමක් සිදුකර නොතිබුණි.

1.3.2 අසම්භාව්‍ය බැරකම්

----------------------

සභාව විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිව රු.4,020,000 ක අලාභ ඉල්ලු නඩුවක් ඇතුළුව නඩු 17ක් සහ සභාවට එරෙහිව බාහිර පාර්ශවයන් විසින් රු.348,000,000 ක වන්දි ඉල්ලා පවරා ඇති නඩු 25ක් අධිකරණයේ විභාග වෙමින් පැවති අතර ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

ලැබිය යුතු ගිණුම්

--------------------

(අ) පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් සභාවට ලැබිය යුතු විනෝද බදු රු.2,781,680 ක් වර්ෂ 10කට වැඩි කාලයක සිට නිරවුල්කර ගෙන නොතිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට රු.188,042 ක් වූ, ලැබිය යුතු නිල නිවාස කුලී ශේෂයෙහි ඇතුලත් එකතුව රු.86,210 ක්වූ හිඟ ශේෂ 09 ක්, නිරවුල් කරගැනීමට පියවර ගෙන නොතිබුණි.

ගෙවිය යුතු ගිණුම්

---------------------

බස්නාහිර පළාත් අමාත්‍යාංශයක සේවයකර 2017 ජුලි 20 දින සභාවේ වැඩභාරගත් නාගරික කොමසාරිස්වරියට අමාත්‍යාංශයේ සේවය කළ 2013 නොවැම්බර් සිට 2017 ජුලි දක්වා හිඟ වැටුප් ලෙස සභාවෙන් ගෙවන ලද රු.259,276 ක් 2018 සැප්තැම්බර් 18 දින වනවිටත් පළාත් සභාවෙන් ප්‍රතිපූර්ණයකර ගෙන නොතිබුණි.

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම.

-------------------------------------------------------

සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට වටිනාකම රු.84,876,210 ක්වූ හිඟ වරිපනම් ශේෂය සම්බන්ධයෙන් විස්තරාත්මක උපලේඛන හා කාල විශ්ලේෂණ විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්.

--------------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම් |
|---|---|---|
| | රු. | |
| (අ) මහා නගර සභා ආඥා පනත | | |
| (i) 130 වගන්තිය | | සභාබලප්‍රදේශය තුල එකතුවන සියළු ආකාරයේ කසළ, සභාවේ දේපලක් විය යුතු අතර ඒ සියළු ද්‍රව්‍ය විකිණීම මගින් ලැබෙන මුදල් සභා අරමුදලට බැර කල යුතු වුවද 2017 වර්ෂයේ සභා බලප්‍රදේශය තුල දෛනිකව එකතු වූ නොදිරන කසළ ආදායම සභා අරමුදලට බැරකර නොතිබුණි. |
| (ii) 251 අ (2) | 198,558,513 | සභාවට අයවිය යුතු සියළු අයවීම් අයකර ගෙන සභාවේ අරමුදල්වලට බැර කිරීම සඳහා අවශ්‍ය සියළු පියවර ගැනීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය වුවත් 2017 දෙසැම්බර් 31 දිනට සභාවට අයවිය යුතු හිඟ ආදායම් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. |
| (ආ) 1971 අංක 48 දරන පළාත් පාලන ආයතන පිළිබඳ විශේෂ විධිවිධාන පනත | - | වරිපනම් බදු අයකිරීම සඳහා සභා බලප්‍රදේශයේ සියළු නිශ්චල දේපල වර්ෂ 05 කට වරක් තක්සේරු කල යුතු වුවත් සභාව විසින් වර්ෂ 07 කට පෙර ලබා ගත් තක්සේරුවක් පදනම් කරගෙන වරිපනම් බදු අයකර තිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| (i) මුදල් රෙගුලාසි 371(5) | 260,135 | නිකුත් කළ අත්තිකාරම්, නිකුත් කරන ලද මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙර පියවිය යුතු වුවද දිගින් දිගටම පැවත එන නොපියවූ අත්තිකාරම් ශේෂයක් පැවතුණි. |
| (ii) මුදල් රෙගුලාසි 571 | 7,707,367 | තැන්පත් කළ දින සිට වර්ෂ 02 ක් ඉක්ම වූ තැන්පතු හඳුනාගෙන විමසීම්කර ආදායමට ගතයුතු වුවත්, වර්ෂ 02 ඉක්ම වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 751 | | ප්‍රධාන ගබඩාවෙන් මොරගස්මුල්ල, බණ්ඩාරනායකපුර වෛද්‍ය මධ්‍යස්ථාන හා දන්ත වෛද්‍ය මධ්‍යස්ථානය සඳහා නිකුත් කළ |

| | | |
|---|---|---|
| | | යන්ත්‍ර හා ලී බඩු ඉන්වෙන්ට්‍රි ගතකර නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 772 (1) | - | වර්ෂයට අදාලව ඉවත් කළ යුතු යැයි ප්‍රධාන ගබඩාවෙ නිර්දේශකළ භාණ්ඩ වර්ග 05 කට අයත් භාණ්ඩ 08 ක් හා භාණ් තොග දෙකක් වෙන්දේසිකර ඉවත් කිරීමට, එම භාණ්ඩ විනාශ කිරීමට 2018 ජුලි 30 දින වනවිටත් පියවර ගෙන නොතිබුණි. |
| (v) මුදල් රෙගුලාසි 1645 | - | නාගරික ඉංජිනේරු ,වෛද්‍ය නිලධාරි හා නීති නිලධාරිගේ පරිහරණය සඳහා සභාවෙන් ලබාදී තිබුණු වාහන 3ක් සඳහා ධාවන සටහන් යාවත් කාලීනව නඩත්තුකර නොතිබුණි. |
| (ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 හා 8.9.2 මාර්ගෝපදේශ | 5,535,500 | 2017 වර්ෂය සඳහා වටිනාකම රු.5,535,500 ක් වූ තාර බැරල් 50 ක් මිලදී ගැනීම සම්බන්ධයෙන් සභාව විසින් සැපයුම්කරු සමග විධිමත් ගිවිසුමක් හෝ විධිමත් ප්‍රතිග්‍රහණ ලිපියක් ලියා අත්සන්ක නොතිබුණි. |
| (ඉ) වෙනත් චක්‍රලේඛ | | |
| (i) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | සභාවේ වාහන සම්බන්ධයෙන් ඉන්ධන දහන පරීක්ෂාවක්ක නොතිබුණි. |
| (ii) 2016 ජුලි 11 දිනැති අංක LGD/8/2016 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 5 ඡේදය | - | සභාවට අයත් වැළිකඩ පොලීසිය අසල ඉඩම රථගාලක් සඳහා 201 වර්ෂයේදී කුලී පදනම මත පෞද්ගලික ආයතනයකට ලබා තිබුණද දෙපාර්ශවය අතර ලිඛිත නෛතික ගිවිසුමක් ඇතිකර ගෙ නොතිබුණි. |
| (iii) 2016 නොවැම්බර් 09 දිනැති අංක LGD/13/2016 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | - | වර්ෂ 03 කට වරක් වත් කඩකුලී තක්සේරුකර සංශෝධනය කල යුතු වුවත් දීර්ඝ කාලයක් තිස්සේ කඩකුලී සංශෝධනයක නොතිබුණි. |
| (iv) 1993 නොවැම්බර් 18 දිනැති අංක15 දරන නාගරික සංවර්ධන අධිකාරීයේ සැලසුම් චක්‍රලේඛය | 11,292,851 | නාගරික සංවර්ධන අධිකාරී ගිණුමේ පවතින රු.10,000,000ක අනුමැතියකින් තොරව ස්ථාවර තැන්පතුවල ආයෝජනයකර තිබු අතර 2017 දෙසැම්බර් 31 දිනට එකී මුදල් ගිණුමේ රු.1,292,851ක ශේෂයක් අකර්මන්‍යව පැවතුණි. |

## 02 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.248,629,914 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.663,783,644 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.116,513 ක් වටිනා අගරු චෙක්පත් 36 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 186 (4) (අ) ප්‍රකාරව කටයුතුකර නොතිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්,රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | රු. | රු | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) වරිපනම් හා බදු | 212,000,000 | 238,345,909 | 243,444,275 | 87,657,889 | 208,925,000 | 241,757,389 | 231,422,931 | 97,915,454 |
| (ii) කුලී | 57,609,000 | 29,283,412 | 29,618,519 | 4,541,197 | 37,340,000 | 26,052,637 | 26,435,504 | 5,092,955 |
| (iii) බලපත්‍ර ගාස්තු | 5,961,000 | 6,236,406 | 6,236,406 | - | 7,685,000 | 4,502,307 | 4,500,057 | - |
| (iv) වෙනත් ආදායම් | 368,458,000 | 334,748,201 | 334,461,957 | 1,074,055 | 288,609,000 | 716,177,877 | 715,689,246 | 600,000 |

2.3.2 වරිපනම් හා බදු

-------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2017 වර්ෂය තුල රු.3,952,452 ක වරිපනම් බදු කපා හැර තිබූ අතර ඒ සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපාර 319 කින් රු.874,000 ක ව්‍යාපාර බදු ආදායමක් හා ව්‍යාපාර 209 කින් රු.448,500 ක ව්‍යාපාර බලපත්‍ර ආදායමක් අයවී නොතිබුණි.

2.3.3 කුලී

-----

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) නුගේගොඩ ජනතා පොලේ බක්කි කඩ 110 කින් 2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ කුලිය රු.720,000 ක් වූ අතර එයින් වර්ෂ 1 සිට වර්ෂ 4 දක්වා කාල පරාසයක් තුල බක්කි කඩ 40 ක හිඟහිටි කුලිය රු.623,000ක් විය.

(ආ) ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 5:3 ඡේදයේ සඳහන් පරිදි සභාව විසින් නියමිත නිල නිවාස කුලිය අයකර නොගැනීම නිසා 2017 වර්ෂය සඳහා රු.39,240 ක් අඩුවෙන් අයකර ගෙන තිබුණි.

(ඇ) ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 5:2:1 ඡේදය පරිදි නිල නිවාස කුලී ලෙස නිලධාරියාගේ වැටුපෙන් සියයට 12 ½ ක් අයකළ යුතු වුවත්, සභාවේ නිල නිවාසවල පදිංචි නිලධාරීන් 06 දෙනෙකුගෙන් ආර්ථික කුලියක් අයකිරීම නිසා 2017 දෙසැම්බර් 31 දිනට රු.175,176ක් අඩුවෙන් අයකර තිබුණි.

2.4 අධිභාර

---------

මහා නගර සභා ආඥා පනතේ (252 වන අධිකාරය) 226 (1) වගන්තිය යටතේ නිකුත් කරන ලද අධිභාර සහතික 14කට අදාලව 2017 දෙසැම්බර් 31 දිනට අයකළ යුතු අධිභාර වටිනාකම රු.25,550,166 ක් විය.

3 මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කාර්යසාධනය

-----------------

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අත්හැර දැමූ කර්තව්‍යයන්

----------------------------

සමාලෝචිත වර්ෂය තුළදී ඉටු කිරීමට නියමිතව තිබූ වටිනාකම රු.1,955,502 වූ ව්‍යාපෘති 4 ක් අතහැර දමා තිබුණි.

(ආ) ව්‍යාපෘති ප්‍රමාද කිරීම.

------------------------

(i) අංගම්පිටිය නිවාස සංකීර්ණය ඉදිකිරීම.

--------------------------------------------

සභාව විසින් 2015 වර්ෂයේදී රු.48,320,909 ක් වැයකර ඉදිකර තිබුණු දෙමහල් නිවාස සංකීර්ණය, 2016 වර්ෂයවන විට බිත්ති හා ස්ලැබ් තට්ටුව පුපුරා යමින් පවතින බව නේවාසිකයන් විසින් සභාව වෙත දැනුම් දී තිබුණි. සභාව විසින් එහි නේවාසිකයන් එම ගොඩනැගිල්ලෙන් ඉවත්කර, තාවකාලික පදිංචි ස්ථාන ලබා දී තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයෙන් උපදෙස් ලබාගැනීම වෙනුවෙන් රු.991,405 ක් වැයකර තිබූ නමුත් 2018 අගෝස්තු වනවිටත් ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණයකර නේවාසිකයන්ට භාරදීමට කටයුතුකර නොතිබුණි.

(ii) සභාව විසින් සිය බලප්‍රදේශය තුල ඇති මාර්ග කාපට් කිරීම, පෙරමුසු යොදා සංවර්ධනය කිරීම, නැවත තාර ඇතිරීම වැනි සංවර්ධන කටයුතු සඳහා 2017 වර්ෂයට අදාලව ඉටු කිරීමට යෝජිත ඇස්තමේන්තුගත පිරිවැය රු.20,786,948 ක් වූ ව්‍යාපෘති 09 ක් ඉටුකර නොතිබුණි.

(iii) 2017 වර්ෂය සඳහා අයවැය ලේඛනයෙන් මාර්ග හා වෙනත් සංවර්ධන ව්‍යාපෘති සඳහා රු.500,000,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද සමාලෝචිත වර්ෂයේදි සභා අරමුදලින් කිසිදු සංවර්ධන ව්‍යාපෘතියක් ආරම්භකර නොතිබුණි.

(iv) මහජන උපයෝගිතා දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂයේදී ඉටු කිරීමට නියමිතව තිබුණු ඇස්තමේන්තුගත වටිනාකම රු.9,600,000ක් වූ ව්‍යාපෘති 02ක් සම්බන්ධයෙන් ප්‍රතිපාදන සලසා තිබුණද එම ව්‍යාපෘති ක්‍රියාත්මකකර නොතිබුණි.

(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) බස්නාහිර පළාතේ 2008 අංක 01 දරන නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ රීතිවල 18 (1) ඡේදය අනුව පළාත් පාලන ආයතනයට ගෙවනු ලබන බදුවලට අමතරව, කසළ වියදම් පියවා ගැනීම සඳහා ගෘහ මූලිකයා විසින් භාවිත ගාස්තුවක් ගෙවීමට බැඳී සිටින බව සඳහන් වුවත් සභා බලප්‍රදේශයේ පිහිටි නිවාසවලින් එවැනි ගාස්තුවක් අයකර නොතිබුණි.

(ii) කසළ කළමනාකරණය පිළිබඳ මාසික ප්‍රගති වාර්තා පිළියෙල කිරීම, සමාලෝචනය කිරීම හෝ අධීක්ෂණය සිදුකර නොතිබුණි.

(iii) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව ඒ ඒ කොට්ඨාශවලට අදාලව දිරන හා නොදිරන කසළ වෙන්කර එකතු කිරීම නියමිත කාල සටහනකට අනුව සිදු කරනු ලබන බවට සඳහන් වුවද එවැනි කාල සටහනක් පිළියෙලකර නොතිබුණි.

(iv) බස්නාහිර පළාත් පාලන කොමසාරිස්ගේ කසළ කළමනාකරණය විධිමත් කිරීම යටතේ අංක LGD/03/2017 දරන 2017 මැයි මස චක්‍රලේඛය අනුව පළාත් පාලන ආයතනය විසින් එකතු කරනු ලබන සියළුම කසළ සියයට 100 ක් වෙන්කර භාර ගැනීම අනිවාර්යෙන් සිදුකළ යුතු වුවත් බලප්‍රදේශයේ කසළ එකතු කිරීම සම්බන්ධයෙන් එවැනි පිළිවෙතක් අනුගමනයකර නොතිබුණි.

(v) සභා බලප්‍රදේශයේ අංක 6,7,8,9 හා 10 යන කොට්ඨාශයන්හි කසළ කළමනාකරණය සම්බන්ධයෙන් සභාව විසින් පෞද්ගලික ආයතනයක් සමග 2017 මාර්තු 28 දින ගිවිසුමකට එළඹ තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී ඒ සඳහා රු.97,059,268 ක් වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

- ගිවිසුමේ 4 හා 5 කොන්දේසි ප්‍රකාරව ටෙන්ඩර්කරු විසින් අදාල කොට්ඨාශවල කසළ තෝරා එකතුකර නොතිබුණි.

- ගිවිසුමේ 17වන වගන්තිය අනුව මාර්ගවල වල් පැළෑටි ගැලවීම සිදුකර ඇති බවට හෝ නියැදි පරීක්ෂණයක් කළ බවට හෝ අධීක්ෂකයින් විසින් සහතිකකර නොතිබූ නමුත් ඒ සඳහා මසකට රු.979,300 බැගින් වර්ෂය සඳහා රු.11,661,572 ක් ගෙවා තිබුණි.

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක
------------------------------
තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත් වී නොමැති බව නිරීක්ෂණය විය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා
------------------------------------

(අ) " අසිරිමත් කෝට්ටේ " ග්‍රන්ථය මුද්‍රණය කිරීම
----------------------------------------------------
පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2015 වර්ෂයේදී රු.2,825,375 ක් වැයකර මුද්‍රණය කරන ලද " අසිරිමත් කෝට්ටේ" නැමති ග්‍රන්ථයේ පිටපත් 4000 කින් පිටපත් 3891 ක් ගබඩාවට ලැබීතිබූ අතර 2018 අගෝස්තු 13 දිනට පිටපත් 3216 ක් ගබඩාවේ පැවතුණි.

(ii) ග්‍රන්ථ 3216 ක් ගබඩාවේ ඉතිරිවී තිබීම නිසා ග්‍රන්ථය මුද්‍රණය කිරීමේ පරමාර්ථය ලෙස සභාව විසින් දක්වා තිබූ පරිදි "කෝට්ටේ ඓතිහාසික ශ්‍රී විභූතිය රට පුරා පාසැල්, විශ්ව විද්‍යාල සිසුන් මෙන්ම මුළු මහත් පාඨක ජනතාව අතරට ගෙන ගොස් කෝට්ටේ ඓතිහාසික අභිමාණය නැවත සිහියට නැගීම සඳහා" යන මුඛ්‍යය පරමාර්ථය ඉටු වී නොතිබුණි.

(iii) ගබඩාවට ලැබීතිබූ ග්‍රන්ථ 3891 කින් බාහිර පාර්ශවයක් වෙත නිකුත්කර තිබූ ග්‍රන්ථ 30ක් වෙනුවෙන් අයවිය යුතු රු.51,000 ක් අයකරගෙන නොතිබුණි.

(iv) 2015 ජනවාරි එම පොත් ආවරණය සඳහා රු.113,700 ක් වටිනා ආවරණ කවර 1516ක් මිලදී ගෙන තිබූ අතර 2018 සැප්තැම්බර් වනවිට එයින් කවර 977 ක් ගබඩාවේ නිෂ්ක්‍රියව පැවතිණි.

(ආ) පාසල් ළමුන් සඳහා පොත් බෙදා දීම.

2016 අධ්‍යයන වර්ෂය වෙනුවෙන් පාසල් ළමුන් සඳහා බෙදා දීමට මිලදී ගෙන තිබුණු රු.192,746ක් වටිනා අභ්‍යාස පොත් 7135 ක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන ගබඩාවේ ගොඩගසා තිබුණි.

(ඇ) 60 වත්ත වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ මැහුම් පාඨමාලාව

60 වත්ත වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ පවත්වාගෙන යන මැහුම් පාඨමාලාවට අභ්‍යාසලාභීන් 26 දෙනෙකු සහභාගිවන නමුත් එක් මහන මැෂිමක් පමණක් යොදවා තිබුණි. තවද පාඨමාලාව සඳහා විෂය නිර්දේශයක් ඉදිරිපත්කර නොතිබුණු අතර පාඨමාලාව අවසන් කරන සිසුන් සඳහා න්‍යායාත්මක / ප්‍රායෝගික ඇගයීමක් සිදුකර සහතිකපත් නිකුත්කර ඇති බවට සාක්ෂි නොතිබුණි.

(ඈ) සභාව සතු ඉඩමේ මායිමෙන් ගේට්ටුවක් ඉදිකිරීම.

රාජගිරිය පොලීසිය අසල ඇති සභා භූමියේ බටහිර මායිම් සීමාවේ පෞද්ගලික ව්‍යාපාරික ස්ථානයට ඇතුල්වීමට ප්‍රධාන පිවිසුම් මාර්ගයක් තිබියදී අතුරු මාර්ගයක් ලෙස, සභාව සතු ඉඩමේ මායිමෙන් ගේට්ටුවක් ඉදිකර තිබුණි. මේ සම්බන්ධයෙන් සභාව විසින් කිසිදු නීතිමය පියවරක් ගෙන නොතිබුණි.

## 3.3 මානව සම්පත් කළමනාකරණය

### (අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත

2017 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත පරිදි විය.

| ශ්‍රේණිය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| මාණ්ඩලික | 19 | 13 | 06 | - |
| ද්විතීක | 178 | 195 | 28 | 45 |
| ප්‍රාථමික | 770 | 741 | 29 | - |
| වෙනත් | 06 | 03 | 03 | - |
| | 973 | 952 | 66 | 45 |

(i) අනුමත කාර්ය මණ්ඩලය තුල හෙද නිලධාරීන් 4 දෙනෙකු හා ඖෂධවේදීන් 4 දෙනෙකුගේ පුරප්පාඩු පැවති අතර මොරගස්මුල්ල වෛද්‍ය මධ්‍යස්ථානයේ ඖෂධ නිකුත් කිරීමේ කාර්යය කම්කරු සේවකයෙකුට පවරා තිබුණි.

(ii) සභාවේ රියදුරකු 2016 අගෝස්තු සිට ප්‍රධාන අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට අනුයුක්ත කර සිටි අතර සභාව විසින් එදින සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා ඔහුගේ වැටුප හා අතිකාල ලෙස රු.669,955 ක් ගෙවා තිබුණි.

(ආ) සේවක ණය
--------------

(i) ස්ථාන මාරු වී ගිය, විශ්‍රාම ගිය, මිය ගිය හා සේවය හැරගිය සේවකයින්ගෙන් අයවිය යුතු ණය ශේෂය රු.3,113,569 ක් වූ අතර සේවක වර්ගය අනාවරණය නොවූ රු.113,536 ක ණය ශේෂයක් පැවතුණි.

(ii) වර්ෂ 10 කට වැඩි කාලයක් තිස්සේ පැවත එන රු.1,786,633 ක හඳුනා නොගත් සේවක ණය ශේෂයක් නිරවුල්කර ගැනීමට කටයුතුකර නොතිබුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා
-------------------------------
පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභා බලප්‍රදේශය තුල ජලනල සම්බන්ධතා සඳහා මාර්ග කැඩීම් 475 ක් වෙනුවෙන් 2017 ජනවාරි සිට දෙසැම්බර් දක්වා මහජනයාගෙන් රු.4,238,931 ක ආදායමක් එකතු කරගෙන තිබුණද එම මාර්ග හානි කඩිනමින් යථාවත් කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.

(ආ) 2017 වර්ෂයේ ජනවාරි සිට නොවැම්බර් දක්වා වූ මාස 11 ක කාලය තුල ගලිරථ සේවාව මගින් රු.1,129,044 ක ආදායමක් උපයාගෙන තිබුණු අතර මේ සඳහා සභාව විසින් රු.3,371,359 ක වියදමක් දරා තිබුණි. ඒ අනුව ගලිරථ සේවාව පවත්වා ගෙන යාම තුලින් රු.2,242,315 ක අසාමාන්‍ය ඌනතාවයක් පැවතුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට සභා බලප්‍රදේශයේ කොට්ඨාශ 10 කින් අයවිය යුතු කසළ බදු රු.7,191,550 ක් අයකරගෙන නොතිබුණි.

3.5 වත්කම් කළමනාකරණය
-----------------------------

3.5.1 නිශ්ක්‍රිය/ඌන උපයෝජිත වත්කම්
--------------------------------------

(අ) මොරගස්මුල්ල වෛද්‍ය මධ්‍යස්ථානය තුල වටිනාකම රු.115,625 ක් වූ උපකරණ 03ක් ක්‍රියාවිරහිතව පැවතුණි.

(ආ) 1994 වර්ෂයේදී ළමුන් 25 දෙනෙකුට ප්‍රමාණවත්වන පරිදි වැලිකඩ දිවා සුරැකුම් මධ්‍යස්ථානය සඳහා ඉදිකර තිබූ ගොඩනැගිල්ල මේවනවිට අතහැර දමා තිබුණි.

3.5.2 වාහන උපයෝජනය

------------------------

(අ) අබලි තත්ත්වයේ හා පාවිච්චියට ගත නොහැකි තත්ත්වයේ පැවති ගත් මිල රු.8,972,020 ක් වූ වාහන 07ක් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් අපහරණ කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) සංචිතයේ පවතින කැබ් රථයක් මාසයේ වැඩි දින ගණනක් සභා පරිශ්‍රයේ ගාල්කර නොතිබුණි.

(ඇ) නිල වාහන හිමි නිලධාරියා එම වාහනය තමා විසින්ම පැදවීම සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99 අනුව අනුමැතිය ලබාගෙන නොතිබුණි.

3.6 අවිධිමත් ගනුදෙනු

---------------------

රජයේ නිලධාරීන් නොවන දේපළ තහනම් කිරීමේ නිලධාරීන් 05ක් සඳහා 2017 අප්‍රේල් 20 දින රු.10,000 බැගින් උත්සව අත්තිකාරම් ගෙවා තිබුණි.

3.7 හඳුනාගත් පාඩු

-----------------

(අ) සභාවට අයත් පුස්තකාල 04 හි 2014 හා 2016 වර්ෂවල පොත් සමීක්ෂණයේදී අනාවරණය වූ රු.1,077,715ක අස්ථානගත වූ පොත් සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි.

(ආ) ජනක රණවක ක්‍රීඩාංගණයේ 2017 වර්ෂයේ විදුලි බිල්පත් ගෙවීමේදී ප්‍රමාද ගාස්තු ලෙස රු.4,836 ක් ගෙවා තිබුණි.

3.8 ප්‍රසම්පාදනය

----------------

3.8.1 ප්‍රසම්පාදන සැලැස්ම

-----------------------

2017 වර්ෂය සඳහා සකස්කර තිබූ ප්‍රසම්පාදන සැලැස්ම මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ 2006 මාර්තු 24 දිනැති අයවැය චක්‍රලේඛ අංක 128 ප්‍රකාරව සකස්කර නොතිබූ බව නිරීක්ෂණය විය.

3.8.2. කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

3.8.2.1 ජනජයසිටි ව්‍යාපෘතිය

-------------------------

සභාව විසින් රු.1,687,986,224 ක කොන්ත්‍රාත් වටිනාකමකට 2014 අගෝස්තු 01 දින පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකු සමග ගිවිසුම්ගත වී 2017 දෙසැම්බර් 31 දිනට රු.1,718,951,057 ක් ගෙවා තිබුණු අතර එම ගෙවීම තුල ඇතුලත් වූ රු.30,964,834 ක් වූ අසම්භාවයන් හා අමතර වැඩ සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 ප්‍රකාරව කටයුතුකර නොතිබුණි. කොන්ත්‍රාත්කරුට ගෙවීම් ප්‍රමාද කිරීම මත ගිවිසුම් කොන්දේසි කඩකිරීම වෙනුවෙන් පවරා තිබූ පොලී ගාස්තුව හා අතිරේක පිරිවැය රු.132,719,730 ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණු අතර 2018 ඔක්තෝබර් 15 දිනවන විටත් කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘතිය අවසන්කර සභාවට භාරදී නොතිබුණි.

3.8.2.2 ජයරජසිටි ව්‍යාපෘතිය

------------------------

සභාව විසින් රු.619,276,616 ක වටිනාකමකට පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකු සමග 2016 පෙබරවාරි 15 දින ගිවිසුම්ගත වී තිබුණු අතර රු.27,867,447 ක ගාස්තුවකට උපදේශක සමාගමක් සමග ගිවිසුම්ගත වී තිබුණි. ගොඩනැගිල්ල ඉදිකිරීමේදී එහි ව්‍යුහාත්මක සැලැස්මෙහි පැවති දෝෂ හේතුවෙන් පාදමෙහි හා බිත්තිවල ඉරිතැලීම් හට ගැනීම නිසා ඉදිකිරීම් කටයුතු නවතා තිබූ නමුත් උපදේශක සමාගමට මුළු ගාස්තුවෙන් සියයට 95 ක් වූ රු.26,381,183ක් හා කොන්ත්‍රාත්කරුට රු.216,974,201ක් ගෙවා තිබුණි. සැලසුම් වෙනස් කිරීමට, ව්‍යාපෘතියේ අධීක්ෂණ කටයුතු හා උපදේශනය වෙනුවෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයට රු.1,373,000 ක් ගෙවීමට නිර්දේශකර තිබුණි. 2018 සැප්තැම්බර් 10 වනවිට කොන්ත්‍රාත්කරු ව්‍යාපෘතිය අතහැර ගොස් තිබුණි.

3.8.2.3 වැලිකඩ පොලීසිය අසල ඉඩමේ නව නගර සභා කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම.

------------------------------------------------------------------------------------------

2013 මැයි 28 දිනැති සභා සම්මුතිය අනුව වැලිකඩ පොලීසිය අසල පිහිටි සභාවට අයත් ඉඩමක නව නගර සභා කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාල ගෘහ නිර්මාණ කටයුතු සඳහා උපදේශන සේවා වෙනුවෙන් රු.36,010,657 ක ගාස්තුවක් යටතේ උපදේශක සමාගමක් සමග 2015 ජනවාරි 26 දින ගිවිසුම් ගතවී තිබුණු අතර එකී සමාගමට රු.22,220,340 ක් ගෙවා තිබුණි. 2015 මැයි 07 දිනැති සභා තීරණයක් මත ඉහත ඉදිකිරීම දැනට පවතින සභා පරිශ්‍රයෙහි ඉදිකිරීම සඳහා උපදේශක සමාගම සමග ගිවිසුම්ගත වී තිබුණු අතර ඒ වෙනුවෙන් රු.4,000,000 ක් ගෙවා තිබුණද 2018 සැප්තැම්බර් 30 දින වනවිටත් ඉදිකිරීම් ආරම්භකර නොතිබුණි. සභාවෙන් අයවිය යුතු රු.15,138,788 ක් අයකර ගැනීම සඳහා උපදේශක සමාගම විසින් සභාවට එරෙහිව බේරුම්කරණ නඩුවක් පවරා තිබුණු අතර ඒ වෙනුවෙන් නඩු ගාස්තු ලෙස රු.259,000 ක් වැයකර තිබුණි. එම නිසා මෙම කොන්ත්‍රාත්තුව වෙනුවෙන් වැයකර තිබුණු රු.26,479,340 ක මුදල ආර්ථික හා ඵලදායී බවින් තොර වියදමක් බවට පත්ව තිබුණි.

3.8.2.4 මොරගස්මුල්ල 4 වන පටුමගෙහි සායන ගොඩනැගිල්ල ඉවත්කර මහල් නිවාස සංකීර්ණයක් ඉදිකිරීම.

----------------------------------------------------------------------------------------------------------------

සභාවට අයත් මොරගස්මුල්ල 4 වන පටුමගෙහි පිහිටි ඉඩමක පැවති පැරණි ගොඩනැගිල්ල කඩා ඉවත්කර නිවාස ඒකක 18 කින් යුත් සිව්මහල් නිවාස සංකීර්ණයක් ඉදිකිරීම සඳහා රු.69,704,581 ක කොන්ත්‍රාත් වටිනාකමකට 2016 ජුනි 01 දින පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකු සමග එළඹ තිබුණු ගිවිසුමකට අනුව 2016 දෙසැම්බර් 31 දින වනවිට ඉදිකිරීම් අවසන්කර භාරදිය යුතු වුවත් 2018 සැප්තැම්බර් 16 දින වනවිට කොන්ත්‍රාත්කරු වැඩබිම අතහැර ගොස් තිබුණි. 2017 ජූලි 31 දින වනවිට සභාව කොන්ත්‍රාත්කරුට රු.25,511,312ක් ගෙවා තිබුණු අතර පැරණි ගොඩනැගිල්ල කැඩීමෙන් ඉවත්කළ ලී දඬු, වහල සෙවිලි කිරීම් හා දොර ජනෙල් ආදී භාණ්ඩ ගබඩාවට භාර දී නොතිබුණි.

3.8.2.5 ගෝමස් ගාඩ්න් නව කායවර්ධන මධ්‍යස්ථානය සහිත දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම.

--------------------------------------------------------------------------------------------

සභාවට අයත් ඔබේසේකරපුර ගෝමස් ගාඩ්න් කායවර්ධන මධ්‍යස්ථානය වෙනුවෙන් වර්ග අඩි 1493ක දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2015 ජනවාරි 19 දින රු.10,087,049ක බදුසහිත වටිනාකමකට පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙකුට පවරා තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) උක්ත කොන්ත්‍රාත්කරු සමග 2015 පෙබරවාරි 16 දින සභාව ගිවිසුමකට එළඹ තිබුණද, මහා නගර සභා ආඥා පනතේ 228 ප්‍රකාරව ගිවිසුම සභාවේ පොදු මුද්‍රාවෙන් මුද්‍රා තබා නොතිබුණි.

(ආ) මහා නගර සභා ආඥා පනතේ 227 අනුව යම් වැඩක් කිරීම හෝ සේවාවක් ඉටු කිරීම සඳහා යම් ගිවිසුමකට ඇතුලත් විය හැක්කේ ඒ කටයුතු සඳහා අවශ්‍ය මුදල් අයවැය ලේඛනයක් මගින් වෙන්කර තිබේනම් පමණක් වුවද ඉහත ඉදිකිරීමේ ඇස්තමේන්තුගත පිරිවැය 2014 අයවැය ලේඛනයට ඇතුලත්කර අවශ්‍ය ප්‍රතිපාදන සලසාගෙන නොතිබුණි.

(ඇ) මහා නගර සභා ආඥා පනතේ 173 වගන්තිය ප්‍රකාරව ගොඩනැගිලි සැලැස්ම අනුමතකර නොතිබුණි.

(ඈ) සභාව විසින් පූර්ව ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් නිසි අවධානයකින් තොරව ක්‍රියාකිරීම හේතුවෙන් අවට නිවැසියන්ගේ විරෝධතා පැනනැගී තිබුණු බැවින් මූලික සැලැස්මට අනුකූල පරිදි ගොඩනැගිල්ල ඉදිකිරීමට නොහැකිවීම නිසා ඉංජිනේරුවරයාගේ උපදෙස් පරිදි මූලික සැලසුමෙන් බැහැරව ගොඩනැගිල්ල ඉදිකර තිබුණද ඒ සඳහා සංශෝධිත සැලැස්මක් සකස්කර අනුමත කරගෙන නොතිබුණි.

(ඉ) වර්ග අඩි 1025 ක ඉදිකිරීම් නිමකර තිබූ ගොඩනැගිල්ල වෙනුවෙන් සභාව විසින් 2016 ජූනි 28 දිනට රු.58,46,632 ක් ගෙවා තිබුණි. මේ අනුව ගොඩනැගිල්ල ඉදිකිරීමේදී වර්ග අඩියකට රු.5,702 ක් වැනි ඉතා අධික පිරිවැයක් දරා තිබුණත් 2018 පෙබරවාරි 22 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී ගොඩනැගිල්ලේ පහත මාලයේ පැති බිත්තිය තුලට ජලය කාන්දු වීම නිසා එහි කපරාරුව බොල් වී තිබුණි.

(ඊ) ඉහත ගොඩනැගිල්ල ඉදිකර තිබුණු භූමිය සභාවට අයත් දේපලක් බවට තහවුරු කරගෙන නොතිබුණි.

3.8.2.6 නානායක්කාර මාවතේ නගර සභා වැඩ ඒකකය, වාහන නඩත්තු ඒකකය සහ ගබඩා සංකීර්ණ ගොඩනැගිල්ල ඉදිකිරීම.

---

2014 ජනවාරි 21 දිනැති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු 30:41 නිර්දේශය හා 2014 ජනවාරි 31 දිනැති මහා සභා තීරණ අංක 6 ප්‍රකාරව රු.46,973,098 කට පෞද්ගලික ආයතනයක් වෙත පිරිනමා තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) තෝරාගත් කොන්ත්‍රාත්කරු ඉක්ටැඩ් ආයතනයේ C-5 ශ්‍රේණියේ සුදුසුකම්ලත් ආයතනයක් බවට තහවුරු කරගෙන නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 7:10 (අ) ප්‍රකාරව ලංසුකරුගේ පශ්චාත් සුදුසුකම් පරීක්ෂණය හා කොන්ත්‍රාත්තුව ඵලදායී ලෙස ඉටුකිරීමේ ඇති හැකියාව හා සම්පත් ඇති බවට සභාව විසින් ඇගයීමක් කළ බවට සාක්ෂි නොවීය.

(ඇ) කොන්ත්‍රාත්කරු විසින් 2014 අගෝස්තු 11 දින උකුවෙල සණස බැංකුවෙන් නිකුත්කර තිබුණු රු.2,348,653 ක කාර්යසාධන ඇපකරය සභාව පිළිගෙන තිබුණද එම බැංකුව ශ්‍රී ලංකා මහා බැංකුවේ අනුමත බැංකුවක් නොවීය.

(ඈ) අත්තිවාරම් ඉදිකිරීම් මට්ටමේදී ගොඩනැගිලි සැලැස්මෙහි ඇතුලත් නොවූ වැඩ සඳහා ඇස්තමේන්තු පිරිවැය ඉක්මවා රු.2,576,329 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

(ඉ) 2015 පෙබරවාරි 12 දින වනවිට කොන්ත්‍රාත්කරුට සියයට 20 ක අත්තිකාරම හා එදිනට කළ වැඩ ප්‍රමාණය වෙනුවෙන් රු.17,651,987 ක් ගෙවා තිබියදී වැඩබිම අතහැර ගොස් තිබුණි. එදිනට සභාව විසින් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබූ වටිනාකම රු.6,183,416 ක් විය.

(ඊ) වැඩබිම අතහැර යන දින වූ 2015 පෙබරවාරි 12 දින වනවිට කොන්ත්‍රාත්කරු විසින් සභාවට ඉදිරිපත්කර තිබුණු වටිනාකම රු.11,743,270 ක බැංකු ඇපකර 2ක් කල්පිරීමට ඉදිරියට මාස 4ක කාලයක් තිබුණද සභාව විසින් එය මුදල් කරගැනීමට පියවර ගෙන නොතිබුණි.

(උ) මේ වනවිට මෙම ඉදිකිරීම සඳහා වැයකර තිබුණු රු.17,651,987 ක මුදල නිශ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි.

3.8.2.7 නුගේගොඩ ගංගොඩවිල සුභද්‍රාරාම අතුල රජමහා විහාරස්ථානයට අයත් ඉඩමක කියවීම් ශාලාව සමග සේවා පියස ඉදිකිරීම.

--------------------------------------------------------------------------------------------------------

නුගේගොඩ ගංගොඩවිල සුභද්‍රාරාම අතුල රජමහා විහාරස්ථානයට අයත් පර්චස් 24.35 ක ප්‍රමාණයක ඉඩම කියවීම් ශාලාවක් සමග සේවා පියසක් ඉදිකිරීම සඳහා සභාව විසින් 2015 මාර්තු 15 සිට 2050 මාර්තු 14 දක්වා වසර 35 ක කාලයකට බදු පදනම මත ලබාගෙන තිබූ අතර ඒ වෙනුවෙන් 2015 අප්‍රේල් මාසයේදී රු.1,680,000 ක් ගෙවා තිබුණි. මෙම ඉඩමේ ප්‍රජා මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු පිරිවැය රු.17,272,350 කට 2015 අගෝස්තු 21 දින පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකුට පවරා තිබුණි. මෙම භූමියේ පස් පරීක්ෂාව වෙනුවෙන් 2015 නොවැම්බර් 26 දින රු.273,615 ක් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට ගෙවා තිබූ අතර 2018 අගෝස්තු 27 දින වනවිට ඉදිකිරීම් අතහැර දමා තිබීම නිසා මේ වෙනුවෙන් වැයකරන ලද රු.1,953,615 ක මුදල නිශ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-------------------------------------------

4.1 අයවැය පාලනය

-------------------

සමාලෝචිත වර්ෂයට අයවැයගත පුනරාවර්තන හා ප්‍රාග්ධන ආදායම් හා වියදම්, සත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී සියයට 50 සිට සියයට 100 දක්වා සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

(අ) වැය විෂයන් 78 ක් සඳහා සලසා තිබූ එකතුව රු.33,822,000 ක් වූ ප්‍රතිපාදන මුළුමනින්ම ඉතිරි වී තිබුණි.

(ආ) වැය විෂයන් 97 ක් වෙනුවෙන් ප්‍රතිපාදනයකර තිබූ රු. 611,118,000 කින් වැයකර නොතිබූ වටිනාකම රු.551,227,157 ක් විය.

4.2 අභ්‍යන්තර විගණනය

------------------------

ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

4.3 පිළිතුරු නොදුන් විගණන විමසුම්

--------------------------------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් නිකුත් කළ වටිනාකම රු.5,846,632 ක් වූ විගණන විමසුමක් සඳහා මෙතෙක් පිළිතුරු සපයා නොතිබුණි.

5. පද්ධති හා පාලන

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර නාගරික කොමසාරිස්වරියගේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|
| (අ) ගිණුම්කරණය | (i) | ඇතැම් ගනුදෙනු ගිණුම්ගත නොකිරීම. |
| | (ii) | ගනුදෙනු අත්හැරීම්, වැඩියෙන් හා අඩුවෙන් දැක්වීම් තිබීම. |
| (ආ) තොග පාලනය | | ප්‍රමාණවත් තොග පවත්වා නොගැනීම. |
| (ඇ) ආදායම් පාලනය | (i) | හිඟ ආදායම් එකතු කිරීම ප්‍රමාණවත් නොවීම. |
| | (ii) | බදු තක්සේරුවක් නොකිරීම. |
| (ඈ) කොන්ත්‍රාත් පාලනය | | අත්හැර දැමීම් හා ප්‍රමාදවීම් තිබීම. |
| (ඉ) අභ්‍යන්තර විගණනය | | ඉදිකිරීම් ව්‍යාපෘති හා මිලදී ගැනීම් විගණනය නොකිරීම. |